# 20 මහගෙදර රාත්‍රියක්

නන්දන වීරසිංහ කවියා නූතන පරපුරේ විශිෂ්ට ගණයේ කවියෙකි. ඔහු විසින් රසවත් අරුත්බර කාව්‍ය නිර්මාණ කිහිපයක් ම රචනා කර තිබේ. ඒ අතරින් කාව්‍ය සංග්‍රහ කිහිපයකට ම රාජ්‍ය සාහිත්‍ය සම්මාන ලැබී ඇත.

'මහගෙදර රාත්‍රියක්' පැදිපෙළ ඔහුගේ පළමු වන කාව්‍ය සංග්‍රහය වන 'ගිංගඟේ විලාපය' කෘතියෙහි අඩංගු වූවකි. අත්දැකීම් පාදක කර ගනිමින් පද්‍ය රචනයේ යෙදීමේ කුසලතාව වර්ධනය කිරීමටත් පද්‍ය රස විඳීමටත් සිසුන් යොමු කිරීමට මේ පාඩමෙන් අපේක්ෂිත යි.



රෑ පානේ තල්ගස්වල පොළට ඇදෙන බර　　බාගෙක
ලන්තෑරුම් එළිය පෙනී හිත පෑරී හඬන　　පැයෙක
ඇතුමල් පාලම පසුකොට එදා කියූ　　සීපදයක
දෝංකාර හඬ සිහිනෙන් මෙන් ඇසුණා දුර　　ඈතක

පිරිත පුරන හඬ මතුවෙයි නා ගහ පන්සල　　පෙදෙසින
බක් මී මල් සුවඳක් ඇල්ලන්ද දිගේ එයි　　දුවගෙන
බොහෝ ඈත දුර දවසක ඇය හා සුදු මානෙල්　　ගෙන
ගිය ගමනක මිහිර හිතේ පැටලී කඳුළක්　　ඉපදෙන

රෑ බස්රිය එදා වගෙ ම හන්දිය පහු කරන කලට
ඉස්ටෝරුව වැඩ ඇරිලා තාත්ත ඇවිදින් මිදුලට
පුතේ කියා අමතන හඬ යළි කිසි දින නෑසෙන්නට
සැඟවිලා ය පාළු මිදුල මැද කිසිවකු නැත පෙනෙන්ට

එළිවෙන පැය ගෙයි ඇතුළත හොල්මන විලසින් ඇවිදින
මා නැහැපුඬු මුළුතැන්ගෙයි පෙර අහරක සුවඳ සොයන
නැඟිට පාන්දර යාමේ කිරි හොද්දයි බතයි උයන
අම්මා සිහි වී මුළු ඇඟ රිදී වේදනා ඇවිළෙන

කෝපි බඳුන ගෙනවිත් අයියේ කියමින් මා අමතන
පුංචි නගේ නුඹේ කිකිණි හඬ හිටි හැටියේ මතුවෙන
මේ මහ ගෙයි මා වටකොට උන් ඔබ හැම කෝ අද දින
පිළිතුරු නැත පිළිකන්නේ පොල්කිච්චෙකි හඬා වැටෙන

## ක්‍රියාකාරකම 01

01. **කවි පෙළ ගායනා කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

i. තම ගම පිළිබඳ ව සිහිපත් කරමින් කවියා අතීතය ස්මරණය කරන අවස්ථා තුනක් සඳහන් කරන්න.

ii. කවියා තමන්ගේ මව හා සම්බන්ධ මතකය අවදි කරන්නේ කුමන ආකාරයට ද?

iii. "මේ මහ ගෙයි මා වටකොට උන් ඔබ හැම කෝ අද දින" යනුවෙන් කවියා පවසන්නේ ඇයි ?

iv. කවි පෙළෙන් ප්‍රකාශ වන්නේ කෙබඳු අත්දැකීමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

iv. පහත දැක්වෙන කාව්‍යෝක්තිවල අර්ථය පැහැදිලි කරන්න.

* "මිහිර හිතේ පැටලී කඳුළක් ඉපදෙන"
* "පිළිතුරු නැත පිළිකන්නේ පොල් කිච්චෙකි හඬා වැටෙන"
* "අම්මා සිහි වී මුළු ඇඟ රිදී වේදනා ඇවිළෙන"
* "බක් මී මල් සුවඳක් ඇල්ලන්ද දිගේ එයි දුවගෙන"
* "එළිවෙන පැය ගෙයි ඇතුළත හොල්මන විලසින ඇවිදින"

vi. කවියා තම අත්දැකීම ප්‍රකාශ කිරීමේ දී යොදා ගන්නා ලද භාෂා උපක්‍රම මොනවා ද?

උදා: අම්මා සිහි වී මුළු ඇඟ රිදී වේදනා ඇවිළෙන යන යෙදුමෙන් අම්මාට තිබූ ආදරය හා තනිකම පිළිබඳ ශෝකාත්මක හැඟීමක් ප්‍රකාශ වේ. මෙවැනි වෙනත් යෙදුම් උපුටාගෙන ඒ පිළිබඳ ව විස්තරයක් ලියන්න.

## ක්‍රියාකාරකම 02

01. මේ වාක්‍යාංශ යොදා ගෙන කවි පදය බැගින් නිර්මාණය කරන්න.
 i. හිත පෑරී හඬන රැයක
 ii. හිතේ පැටලී කඳුළක් ඉපදෙන
 iii. නුඹේ කිංකිණි හඬ
 iv. දෝංකාර හඬ සිහිනෙන් මෙන් ඇසුණා
 v. ඔබ හැම කෝ අද දින

02. පහත සඳහන් අදහස් ප්‍රකාශ වන කාව්‍යෝක්ති පැදිපෙළෙන් උපුටා ලියන්න.
 i. අම්මා සිහි වී සිතට මෙන් ම ගතට දුක දැනෙයි.
 ii. නංගීගේ සිනා හඬ
 iii. මහගෙදර මා තනිවී ඇති බව

### පැවරුම

01. මේ කවිපෙළ ලියූ කවියාගේ වෙනත් නිර්මාණ කියවා රස විඳින්න.

02. තමා කැමති තේමාවක් යොදා ගෙන කවි පෙළක් නිර්මාණය කරන්න.

03. මේ කවි පෙළ ආශ්‍රිත ව චිත්‍රයක් නිර්මාණය කරන්න.

04. නූතන කවීන්ගේ නිර්මාණ එකතු කර පොත් පිංචක් සාදන්න.